www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

**8 ශ්‍රේණිය** | **විද්‍යාව** | **ඒකකය 04 – පදාර්ථයේ ගුණ**

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) පහත දැක්වෙන ශක්ති විශේෂය වන්නේ,
1) වාතය 2) ආලෝකය 3) ජලය 4) බල්බය

02) පහත ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1) පදාර්ථය පිළිබඳ පිළිගත හැකි මතයක් පළමුව ඉදිරිපත් කරන ලද්දේ ඩිමොක්‍රටීස් නම් දාර්ශනිකයාය.
2) ඇරිස්ටෝටල්ගේ මතය වූයේ පදාර්ථය අංශු වලින් සෑදී ඇති බවය.
3) ග්‍රීසියේ ඇතැන්ස් නුවර දී පදාර්ථය පිළිබඳ ප්‍රසිද්ධ විවාදයක පැවැත් විය.
4) පදාර්ථය අසන්තතය.

03) ඝන පදාර්ථයක අංශු සැකසුම නිවැරදිව දැක්වෙන්නේ,
1) අංශු අක්‍රමවත්ව විහිදී ඇත. 2) අංශු අතර බැඳීම් ඉතාමත් දුර්වලය.
3) අංශු ක්‍රමවත් රටාවකට පිහිටයි. 4) අංශු නිදහස් චලන දක්වයි.

04) මූලද්‍රව්‍යයකට උදාහරණයකි.
1) කාබන් 2) කොපර්සල්ෆේට් 3) ජලය 4) ඇමෝනියා

05) ද්‍රව අවස්ථාවේ පවතින ලෝහයකි.
1) රසදිය 2) කාබන් 3) ක්ලෝරීන් 4) ජලය

06) ද්‍රව අවස්ථාවේ පවතින අලෝහ මූලද්‍රව්‍යයකි.
1) රසදිය 2) බ්‍රෝමීන් 3) අයඩීන් 4) ක්ලෝරීන්

07) කොපර් සල්ෆේට් හි අඩංගු සංඝටක මූලද්‍රව්‍ය වනුයේ,
1) කොපර්, සල්ෆර් 2) කොපර්, ඔක්සිජන්, සල්ෆර්
3) කොපර්, ඔක්සිජන් 4) කොපර්, සල්ෆර්, නයිට්‍රජන්

08) නිර්ජලීය කොපර් සල්ෆේට් වල වර්ණය වනුයේ,
1) රතු 2) සුදු 3) නිල් 4) කහ

09) ජලයේ ඝනත්වය $kgm^{-3}$
1) 1000 කි. 2) 1200 කි. 3) 1020 කි. 4) 2000 කි

10) භංගුරතාව දක්වන ද්‍රව්‍යයක් වන්නේ,
1) යකඩ 2) මිනිරන් 3) ඇලුමිනියම් 4) ඊයම්

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

01) අප අවට පරිසරය පදාර්ථ වලින් හා ශක්ති වලින් සමන්විතය.




i. A, B, C පරීක්ෂණ මගින් සොයා බැලීමට අදහස් කරන්නේ කුමක්දැයි වෙන වෙනම ලියන්න.
ii. කොන්ඩිස් හඳුන්වන රසායනික නාමය කුමක්ද ?
iii. C පරීක්ෂණයේ D නම් කරන්න.
iv. කොන්ඩිස් වෙනුවට භාවිතා කළ හැකි වෙනත් ද්‍රව්‍යයක් ලියන්න.
v. C පරීක්ෂණය සඳහා D ද්‍රව්‍ය භාවිතා කිරීමට හේතුවක් ලියන්න.
vi. පන්සලේ හඳුන්කූරු දැල් වූ විට එහි සුවඳ දුර සිටින අයට පවා දැනේ. මෙය විද්‍යාත්මකව පැහැදිලි කරන්න.

02) i. සංශුද්ධ ද්‍රව්‍ය යන්න හඳුන්වන්න.
ii. මූලද්‍රව්‍යයක් යනු කුමක්ද ?
iii. පහත ද්‍රව්‍ය වලින් මූලද්‍රව්‍ය යටින් ඉරක් අඳින්න.
සල්ෆර්, සෝඩියම් ක්ලෝරයිඩ්, කොපර්, ජලය, ඔක්සිජන්
iv. ප්‍රත්‍යාස්ථතාව යන්න පැහැදිලි කරන්න.
v. ද්‍රවාංකය යනු කුමක්ද ?
vi. සංශුද්ධ ජලයේ ද්‍රවාංකය කොපමණද ?
vii. ජලයේ තාපාංකය හඳුන්වන්න.
viii. ප්‍රසාරණතාව පැහැදිලි කරන්න.
ix. ඝනත්වය අර්ථ දක්වන්න.
x. ඝනත්වය මනින සම්මත ඒකකය කුමක්ද ?

03) සිසුන් කණ්ඩායමක් තාප සන්නායකතාව පරීක්ෂා කිරීමට සැලසුම් කරන ලදි.
i. ඉහත ක්‍රියාකාරකමට අවශ්‍ය ද්‍රව්‍ය මොනවාද ?
ii. එම ක්‍රියාකාරකමෙහි රූපසටහනක් ඇඳ නම් කරන්න.
iii. තාප සන්නායකතාව වැඩිම ලෝහය හඳුනා ගන්නේ කෙසේද ?
iv. ලෝහමය මූලද්‍රව්‍ය සතු ගුණාංග 4 ක් ලියන්න.
v. භංගුරතාව යනු කුමක්ද ?
vi. පහත සටහන සම්පූර්ණ කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk




vii. පදාර්ථය සතු පහත ගුණාංග ප්‍රයෝජනයට ගන්නා අවස්ථා සඳහන් කරන්න.

a) දැඩි බව
b) තාප සන්නායකතාව
c) ප්‍රසාරණය
d) ලෝහක දිස්නය

viii. පහත මූලද්‍රව්‍ය ලෝහ හා අලෝහ ලෙස වෙන්කරන්න.

a) සෝඩියම්
b) සිලිකන්
c) ආගන්
d) අයඩීන්
e) කැල්සියම්
f) මැග්නීසියම්
g) සල්ෆර්
h) රසදිය

එච්.එම්.ඩී.ටී.ජී. හඳපාන්ගොඩ

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk